# රිච්මන්ඩ් විද්‍යාලය Richmond College

## පළමු වාර පරීක්ෂණය - 2019

## First Term Test - 2019

**ගණිතය - I, II**

Mathematics - **I, II**

කාලය පැය 1 ½

6 ශ්‍රේණිය

නම :- ............................................ විභාග අංකය :- ..........................

## I කොටස

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

(01)




වෘත්තය මත ඇති ලක්ෂය පෙන්වන අක්ෂරය කුමක් ද?

---

(02) 84325 මෙහි 4 න් නිරූපණය වන අගය 2 න් නිරූපණය වන අගය මෙන් කී ගුණයක්ද?

---

(03) 1817 + 153 + 7 අගය සොයන්න.

---

(04) හිස් කොටුවලට සුදුසු අගය ලියන්න.

```
   8 □ 6
 - □ 2 3
   -----
   5 9 3
   =====
```

---

(05) තුන් බිලියන හැටපන් දහස් හාරසියය ඉලක්කමෙන් ලියන්න.

(අනෙක් පිටුව බලන්න.)

(06) පංතියේ ළමුන් 40 දෙනා අතරේ එක් අයෙකුට පොත් 8 බැගින් බෙදීමට පොත් 5 ක් අඩු විය. තිබූ පොත් ගණන කීයද?

(07) එක්තරා සංඛ්‍යාවක් 100 න් බෙදූ විට ලබ්ධිය 31 ද ඉතිරි 6 ක් ද විය. සංඛ්‍යාව කීයද?

(08) අමරසේකර මහතා උදෑසන ඇවිදින දුර ප්‍රමාණය මීටර් 3065 කි එම ප්‍රමාණය ආසන්න 10 ගුණාකාරයට වටයා ලියන්න.

(09) පෙ.ව 9.45ට ලබා දුන් පෙරහුරු ප්‍රශ්න පත්‍රයක කාලය අවසන් වූයේ පෙ.ව. 11.25 ට ය. ප්‍රශ්න පත්‍රය සඳහා ලබා දුන් කාලය කොපමණ ද?

(10) (-5) හා (-1) අතර ඇති සියලු නිඛිල ලියන්න.

(11) ගමනක් යාමට පැය 3යි. මිනිත්තු 48 ක් ද, නැවත ඒමට පැය 3යි මිනිත්තු 28 ක් ද ගත විය. මුළු ගමන සඳහා ගත වූ කාලය කොපමණද?

(12) පන්තියක සිටින සිසුන් සංඛ්‍යාව ආසන්න 10 ගුණාකාරයට වැටයූ විට 50 වේ. එම පන්තියේ සිටිය හැකි අඩුම සිසුන් ගණන කොපමණ ද?

**(අනෙක් පිටුව බලන්න.)**

(13) තත්පර 165 මිනිත්තු හා තත්පර වලින් දක්වන්න.

---

(14) තලයක තිරස් බව දැන ගැනීමට භාවිතා කරන උපකරණය ලියන්න.

---

(15) පහත ප්‍රකාශන ඉදිරියේ හරි නම් ( ✓ ) ලකුණ ද වැරදිනම් ( X ) ලකුණ ද යොදන්න.

(i) (-3) > (+2) ........................................................

(ii) (+1) > (- 5) ........................................................

---

(16) 135 x 0 අගය කීයද?

---

(17) -3, 4, 0, -1 යන සංඛ්‍යා අවරෝහණ පිළිවෙලට ලියන්න.

---

(18) Aට පෙනෙන සේ B සිටින්නේ කුමන දිශාවක ද?




---

(19)

☐ ☐ x 100 + 2 = 4202 හිස්තැනට සුදුසු ඉලක්කම් දෙක ලියන්න.

---

(20) රූපයේ ලකුණු කර ඇති කෝණ දෙක නම් කරන්න.




$a$ = .............................

$b$ = .............................

(ලකුණු 2 x 20)

**(අනෙක් පිටුව බලන්න.)**

# II කොටස

ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

(01)

(a) මිනිසුන් දෙදෙනෙකුගේ මාසික වැටුප් ප්‍රමාණයක් පහත දැක්වේ.

අමරසිරි මහතා රු. 48,576

පියසිරි මහතා රු. 37,856

(i) 7 ඉලක්කම් වල ස්ථානීය අගයන් වෙ වෙනම ලියන්න.

(ii) 8 ඉලක්කම් වල වටිනාකම් වෙන වෙනම ලියන්න.

(b) A හා B රටවල් දෙකක ජනගහනය පහත දැක්වේ.

A - 208300500116

B - දෙසිය විසි බිලියන තුන්සිය දහස් එකසිය දහසය.

(i) A හි ප්‍රමාණය වචනයෙන් ලියන්න.

(ii) B හි ප්‍රමාණය ඉලක්කමෙන් ලියන්න.

(02)

(a)

(i) (-5) සිට (+5) තෙක් ඇති සංඛ්‍යා රේඛාවක් අඳින්න.

(ii) A = -3, B = + 2 සංඛ්‍යා රේඛාව මත ලකුණු කරන්න.

(iii) A හා B අතර ඇති සියලු නිඛිල ලියන්න.

(iv) -4, +2, -3, 0, +4 ආරෝහණ පිළිවෙලට පෙළගස්වන්න

(03)




1 ......................................

2 ......................................

3 ......................................

4 ......................................

5 ......................................

(i) මෙම රූපයේ අංක 1,2,3,4,5 මගින් දැක්වෙන කෝණ කුමන වර්ගයට අයත් දැයි ලියන්න.

(ii) ඔබගේ පංති කාමරයේ දක්නට ඇති තිරස් තලයක් නම් කරන්න.

(04) නිමල් වෙළඳසැලට යාමට නිවසින් පෙ.ව. 11.10 ට ගමන් ආරම්භ කළ අතර මිනිත්තු 10 තත්පර 12 ට පසු කඩයට පැමිණියහ. ඔහු කඩය තුල ගත කළ කාලය මිනිත්තු 8යි තත්පර 50 කි.

(i) නිමල් නිවසෙන් පිටත් වූ වේලාව පැය 24 ඔරලෝසුවෙන් දක්වන්න.

(ii) ඔහු කඩයට පැමිණි වේලාව කීයද?

(iii) කඩයෙන් පිටත් වූ වේලාව කීයද?

(iv) ඔහු නිවසට පැමිණියේ පෙ.ව. 11.40 නම් ආපසු ඒමට ගතවූ කාලය කොපමණ ද?

(අනෙක් පිටුව බලන්න.)

- - www.mathspapers.info - -

(05) ක්‍රීඩාවක් සඳහා සිසුන් පෙළගස්වා සිටි ආකාරය පහතින් දැක්වේ. සියලු දෙනා උතුරු දිශාවට මුහුණලා සිටගෙන සිටියි. අදාල සිසුන් සිටින තැන් රූප සටහනේ රවුම් තුළ ලියා දක්වන්න. සියලු රවුම් තුළ සිසුන් නොමැති බව ද සලකන්න.




(i) හර්ෂට උතුරින් ගයාන් සිටියි.
(ii) හර්ෂගේ වම් අත පැත්තේ ඩිලාන් සිටියි.
(iii) සරත්ට වයඹ දෙසින් හර්ෂ සිටියි.
(iv) ඩිලාන්ට උතුරින් හා ගයාන්ගේ වම් අත පැත්තෙන් නිමල් සිටියි.
(v) සමන්ට බස්නාහිරින් හර්ෂ සිටියි.

(06)

(a) ප්‍රදර්ශනයක් සඳහා දින 3 ක දී පැමිණි පිරිස පිළිබඳ තොරතුරු පහත වගුවේ දැක්වේ.

| දිනය | සිකුරාදා | සෙනසුරාදා | ඉරිදා |
|---|---|---|---|
| පැමිණි පිරිස | 1428 | 2436 | 1986 |

(i) දින තුනේදී ම පැමිණි නරඹන්නන් ගණන කීයද?
(ii) පැමිණි ගැහැණු සංඛ්‍යාව 1849 ක් නම් පැමිණි පිරිමි සංඛ්‍යාව කීයද?
(iii) ඇතුළත් වීමේ ගාස්තුව එක් අයකුගෙන් රු. 100 ක් නම් දින තුනේ ආදායම කොපමණ ද?
(iv) 20 දෙනෙකු එකතු වී සංවිධානය කළ මෙම ප්‍රදර්ශනයේ ආදායම සමානව බෙදා ගත්තේ නම් එක් අයෙකුට ලැබුණු ආදායම කොපමණ ද?

(b) පහත දැක්වෙන සංඛ්‍යා ආසන්න 10 ගුණාකාරයට වටයන්න
(i) 147
(ii) 155
(iii) 188

(ලකුණු 12 x 5)


ඔබට අවශ්‍ය සියලුම ගණිත ප්‍රශ්න පත්‍ර ( mathspapers.info ) වෙතින් පහසුවෙන්ම ලබාගන්න